ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය – 2014

-----------------------------------------

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සහ එහි පරිපාලිත සමාගම්වල 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. පරිපාලිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශන පරිපාලිත සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කරන ලද වරලත් ගණකාධිකාරී සමාගම් විසින් කරනු ලැබේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ සහ එහි පරිපාලිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ සහ පරිපාලිත සමාගම්වල අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4** තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2.** මූල්‍ය ප්‍රකාශන

**2.1** තත්ත්වාගණනය කළ මතය - සමූහය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සහ එහි පරිපාලිත සමාගම්වල මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

තත්ත්වාගණනය කළ මතය - අධිකාරිය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2** ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

**2.2.1** මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ධ කිරීම

(අ) අධිකාරිය සහ එහි පරිපාලිත සමාගම් 04 ක් ඒකාබද්ධ කර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස් කර තිබුණි. කෙසේ වුවද, විගණිත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ එක් සමාගමක් විසින් පමණි. සමාගම්වල නම් සහ හිමිකාරත්වය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| <u>පරිපාලිත සමාගමේ නම</u> | <u>හිමිකාරත්ව ප්‍රතිශතය</u> |
|---|---|
| මහවැලි උපදේශක කාර්යාංශය (පුද්ගලික) සමාගම | 100 |
| ස්වාභාවික සම්පත් කළමනාකරණ සේවා (පුද්ගලික) සමාගම | 100 |
| මහවැලි වෙන්චර් කැපිටල් (පුද්ගලික) සමාගම | 100 |
| මහවැලි සත්ව සහ කෘෂි ව්‍යාපාරික සමාගම | 100 |

(ආ) මහවැලි ඉංජිනේරු සේවා (පුද්ගලික) සමාගම විසුරුවා හැරීමට 2014 දෙසැම්බර් 04 දින අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබූ අතර, 2014 ජූලි 31 දින සමාගම ඇවර කිරීමට අවශ්‍ය කටයුතු ඉටුකළ බව සමාගම් රෙජිස්ට්‍රාර් විසින් සහතික කර තිබුණි. එහෙත් විසුරුවා හැරීමේ ගිණුම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**2.2.2** අඛණ්ඩ පැවැත්ම

අධිකාරිය සමඟ ඒකාබද්ධ කරන ලද සමාගම් ගිණුම් පිළිබඳ පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය විය.

(අ) මහවැලි වෙන්චර් කැපිටල් සමාගමේ 2014 වර්ෂය සඳහා ආදායම රු.1,018,746 ක් වූ අතර, එයින් රු.328,046 ක් තැන්පතු ආදායම් විය. මෙහෙයුම් ආදායම රු.690,700 ක් වූ අතර, වාර්ෂික මෙහෙයුම් අලාභය රු.164,355 ක් ද, සමුච්චිත මෙහෙයුම් අලාභය රු.7,295,954 ක් ද විය. ඒ අනුව සමාගමේ මෙහෙයුම් කටයුතු කාර්යක්ෂම අයුරින් සිදුනොවන බවත්, අඛණ්ඩ පැවැත්ම කෙරෙහි බලපෑමක් පවත්නා බවත් නිරීක්ෂණය විය.

(ආ) ස්වාභාවික සම්පත් කළමනාකරණ සේවා (පුද්ගලික) සමාගමේ ආදායම් සහ වියදම් පරීක්ෂාවේදී මෙහෙයුම් කටයුතුවලින් ලද ආදායම රු.2,412,855 ක් වූ අතර, මෙහෙයුම් කටයුතුවලට අදාලව බාහිර උපදේශකවරුන්ට හා වෙනත් පාර්ශවයන් වෙත රු.2,453,926 ක් ගෙවා තිබුණු බැවින්, මෙහෙයුම් කටයුතුවලින් වූ තථ්‍ය අලාභය රු.41,071 ක් බව නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ ශුද්ධ අලාභය රු.106,560 ක් වූ අතර අනෙකුත් ආදායම් රු.1,000,605 ක් විය. රු.600,000 ක බැංකු ණයක්ද සමාගමේ පැවතුණි. මෙම සමාගමෙහි මෙහෙයුම් කටයුතු විධිමත්ව හා කාර්යක්ෂමව සිදුනොවන බවත්, මේ නිසා සමාගමෙහි අඛණ්ඩ පැවැත්ම පිළිබඳව ගැටළු පවත්නා බවත් විගණනයේදී නිරීක්ෂණය විය.

**2.2.3** ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාරික (පුද්ගලික) සමාගම විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණු අතර, මහවැලි වෙන්චර් කැපිටල් (පුද්ගලික) සමාගම, ස්වාභාවික සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය, හා මහවැලි උපදේශක කාර්යාංශය (පුද්ගලික) සමාගම විසින් ඉදිරිපත් කර තිබූ ගිණුම්වල අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කර නොතිබුණි.

(ආ) අධිකාරිය යටතේ පවත්නා ගොවිපල 18 ක් සඳහා විධිමත් ගිණුම් ක්‍රමයක් හඳුන්වාදී නොතිබුණි.

**2.2.4** ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරියට අයත් කොළඹ පිහිටි පිරිවැය රු.67,440,853 ක් වූ අක්කර 1 රූඩ් 2 පර්චර්ස් 13.6 ක් වන ඉඩම් කැබලි 03 ක අගය ගිණුම්වල දක්වා නොතිබුණි.

(ආ) මහවැලි කෘෂිකාර්මික හා සත්ව ව්‍යාපාරික සමාගමෙහි ආයෝජනය කරන ලද රු.418,871,277 ක් අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල ආයෝජන යටතේ දක්වනු වෙනුවට විවිධ ණයගැතියන් යටතේ දක්වා තිබුණි.

(ඇ) දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතියට අදාල රඳවුම් මුදල් රු.1,918,988 ක් “සී” කලාපයේ නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය මඟින් ආදායම් වියදම් ප්‍රකාශයෙහි වියදම් ලෙස දැක්වීම හේතුවෙන් ලාභය එම ප්‍රමාණයෙන් අඩුවී තිබුණි.

(ඈ) “සී” කලාපයේ නේවාසික කළමනාකරණ කාර්යාලය වෙත ස්ථාවර තැන්පතු වෙනුවෙන් ලැබිය යුතු පොළිය බැංකුව විසින් තහවුරුකර තිබුණද ලැබියයුතු පොළී රු. 1,000,000 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

**2.2.5** පැහැදිලි නොකළ වෙනස්කම්

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා බදුකුලී ආදායම හා වර්ෂය අවසානයට හිඟ බදුකුලී ආදායම් ගිණුම හා අදාල උපලේඛන සමඟ සැසඳීමේදී පිළිවෙලින් රු.143,741,000 ක හා රු.146,510,000 ක වෙනසක් පැවතියද එම වෙනසට හේතුව පැහැදිලි කර නොතිබුණි. ප්‍රධාන වැඩ මෙහෙයුම් හා නඩත්තු අංශයේ විවිධ තොග සහ ඉන්ධන හා ලිපි ද්‍රව්‍ය තොග සත්‍යාපන වාර්තා හා සැසඳීමේදී පිළිවෙලින් රු.21,343,203 ක හා රු.1,177,434 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන අනුව මහවැලි වෙන්චර් කැපිටල් සමාගමේ කරන ලද ආයෝජන රු. 9,800,000 ක් ලෙස දක්වා තිබුණ නමුත්, ආයෝජනයේ ස්වභාවය පැහැදිලිව දක්වා නොතිබුණි. මහවැලි වෙන්චර් කැපිටල් (පෞද්ගලික) සමාගමේ ගිණුම් අනුව අධිකාරිය විසින් සමාගම් කොටස්වල කරන ලද ආයෝජන රු.10,398,000 ක් ලෙසද, වෙනත් ප්‍රාග්ධනය සඳහා දායකත්වය රු. 351,000 ක් ලෙසද දක්වා තිබුණි. කෙසේ වුවද, සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල මෙවැනි ආයෝජනයක් දක්වා නොතිබුණු බැවින්, මෙම වෙනස්කම් සඳහා හේතු විගණනයට පැහැදිලි නොවීය.

**2.2.6** අවිනිශ්චිත ගිණුම්

--------------------

මහවැලි උපදේශක කාර්යාංශය (පුද්ගලික) සමාගම විසින් ඉදිරිපත් කරන ලද ගිණුම් අනුව ලැබිය යුතු ගිණුම්වල රු.2,134,832 ක අසාමාන්‍ය බැර ශේෂයක්ද ගෙවිය යුතු ගිණුම්වල රු.1,261,164 ක අසාමාන්‍ය හර ශේෂයක්ද ඇතුළත්වී තිබුණි.

**2.2.7** විගණනය සඳහා සාක්ෂි නොවීම

----------------------------------

අධිකාරිය විසින් සමාගම් 04 ක කර තිබුණු රු.19,879,000 ක ආයෝජනය සඳහා වූ ආයෝජන සහතික හා කොටස් සහතික වල පිටපත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**2.3** ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ලැබිය යුතු හිඟ බදු ආදායම වූ රු.704,516,782 කින් රු.342,753,000 ක් වර්ෂ 05 ක් ඉක්මවා තිබූ අතර, රු. 325,187,000 ක් වර්ෂ 03 සිට 05 දක්වා කාලයක් ඉක්මවා තිබුණි. මෙම මුදලින් රු.645,983,499 ක් නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාල 04 කින් ලැබිය යුතු හිඟ බදු ආදායම් බව තව දුරටත් නිරීක්ෂණය විය.

වික්ටෝරියා-කොත්මලේ නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයේ සිදුකරන ලද නියැදි පරීක්ෂාවට අනුව ලබාගත් ඉඩම් සඳහා අධිකාරියේ සේවකයන්ගෙන් අයවිය යුතු හිඟ බදු ආදායම රු. 31,253,000 ක් හෙවත් හිඟ බදු ආදායමෙන් සියයට 21.8 ක් විය.

(ආ) විවිධ ණයගැතියන් හා වෙළඳ ණයගැතියන්ගෙන් ලැබියයුතු මුදල් රු.18,824,000 ක් අවුරුදු 1 සිට අවුරුදු 3 දක්වා කාල පරාසයක හා රු.11,849,000 ක් අවුරුදු 5 ට වැඩි කාලයක සිට හිඟව පැවතුණි.

(ඇ) අයකර ගතයුතු වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම්වලින් රු.1,600,000 ක් අවුරුදු 1 සිට අවුරුදු 3 දක්වා කාල පරාසයක හා රු.7,357,000 ක් අවුරුදු 5 ට වැඩිකාලයක සිට අයකර ගෙන නොතිබුණි. වසර 5 ඉක්මවූ ඉහත මුදලින් රු.6,725,803 ක් 2005 වර්ෂයේදී අවසන්වී තිබූ "බී" කලාපයේ මහවැලි ඒකාබද්ධ ව්‍යාපෘතිය සහ මහවැලි ප්‍රතිසංස්කරණ හා පුනරුත්ථාපන ව්‍යාපෘතියට අදාල මුදලක් බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. අවසාන බිල්පත් සඳහා ගෙවීම් කිරීමේදී මෙම මුදල් අයකර ගැනීමට අදාල නිලධාරීන් කටයුතු නොකිරීම හේතුවෙන් අධිකාරියට පාඩු සිදුවී තිබුණු අතර එම පාඩු සිදුකල නිලධාරීන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීම වෙනුවට අයකරගත නොහැකි මුදල් ඉදිරියේදී කපා හැරීමට කටයුතු කරන බව තවදුරටත් නිරීක්ෂණය විය.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1992 පෙබරවාරි 18 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 7/92 | අධ්‍යක්ෂ ජනරාල්වරයාට වෙන්කර තිබුණු වාහනයට අමතරව සංචිතයට අයත් ඩීසල් වාහනයක්ද රාජකාරියේ යොදවාගෙන තිබූ අතර ඒ සඳහා සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා මාස 09 ක් සඳහා රු.412,852 ක ඉන්ධන ලබාගෙන තිබුණි. |
| (ආ) 1994 ජුනි 14 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 95 | අමාත්‍ය මණ්ඩලය, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හෝ භාණ්ඩාගාරය විසින් නිශ්චිතවම අනුමත කරන ලද ප්‍රතිලාභ පමණක් තම පාලක මණ්ඩලයේ අනුමැතිය සහිතව සේවකයන්ට ගෙවිය හැකි වුවද, එබඳු විධිමත් අනුමැතියක් රහිතව සමාලෝචිත වර්ෂයේදී වික්ටෝරියා කොත්මලේ නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය විසින් බදු එකතු කිරීම සඳහා දිරිදීමනා ලෙස රු.1,272,791 ක් අධිකාරියේ කාර්ය මණ්ඩලයට ගෙවා තිබුණි. තවද, එම දිරිදීමනා ලෙස රු.278,853 ක් ලබාගත් නිලධාරීන් 11 දෙනෙකු විසින් 2014 දෙසැම්බර් 31 දිනට අධිකාරියට ගෙවිය යුතු වූ හිඟ බදු මුදල රු.2,427,600 ක් බව හෙළිදරව් විය. |

| | | |
|---|---|---|
| (ඈ) | 2009 මැයි 06 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය | අධිකාරියට අයත් ඉඩම්වලින් ඉවත් කර ගනු ලබන පස් කියුබ් එකකට රු. 560 බැගින් රාජ්‍ය භාගයක් කොන්ත්‍රාත්කරුවන් විසින් ගෙවිය යුතු වුවත්, නියැදි පරීක්ෂාවකදී හෙළිකර ගත් පරිදි කොන්ත්‍රාත් 16 ක් වෙනුවෙන් ඇස්තමේන්තු කර තිබූ පස් කියුබ් 17,731 ක් ඉවත් කර ගැනීමේදී "බී" කලාපයේ නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය වෙත සමාලෝචිත වර්ෂයේදී ලැබිය යුතු රාජ්‍ය භාගය රු.9,929,360 ක් අයකරගෙන නොතිබුණි. |
| (ඇ) | අභ්‍යන්තර චක්‍රලේඛ හා මූල්‍ය කාර්ය පරිපාටි සංග්‍රහය<br>මූල්‍ය කාර්ය පරිපාටි සංග්‍රහය 1.5.1 ඡේදය හා 2012 මාර්තු 15 දිනැති අංක 02/2012 අභ්‍යන්තර චක්‍රලේඛයෙහි 5 වන වගන්තිය | අවස්ථා 15 කදී නිලධාරීන් 15 දෙනෙකු විසින් ලබාගෙන තිබුණු රු.117,012 ක ඉන්ධන අත්තිකාරම් මුදල් භාවිතා නොකර සම්පූර්ණයෙන්ම ආපසු පියවා තිබුණි. එහිදී දින 14 සිට දින 118 දක්වා ප්‍රමාද වූ අවස්ථා 13 ක් නිරීක්ෂණය විය. |

**2.5** ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

-----------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 ජනවාරි 16 සිට 25 දක්වා ඉන්දියාවේ පවත්වන ලද චිත්තවේද සමබරතාවය තුළින් ඵලදායීතා වර්ධන වැඩමුළුවකට නිලධාරීන් දස දෙනෙකු සහභාගී කරවීම සඳහා 2014 දෙසැම්බර් මාසයේදී රු. 1,501,960 ක් වැය කර තිබුණි. අධිකාරියේ කාර්යයන්ට සෘජු සම්බන්ධයක් නොමැති මෙම වැඩසටහන සඳහා අයවැයෙහි ප්‍රතිපාදන නොතිබූ අතර, මෙම වැඩසටහන ක්‍රියාකාරී සැලැස්මටද ඇතුළත්ව නොතිබුණි. තවද, මේ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක්ද ලබාගෙන නොතිබුණි.

අධිකාරියේ ප්‍රතිපත්තිය අනුව විදේශ සංචාරයක් සඳහා සහභාගීවූ නිලධාරියෙකුට වර්ෂයක් ගතවන තුරු වෙනත් සංචාරයක් සඳහා අවස්ථාව ලබා නොදෙන නමුත්, මෙයට සහභාගී කර තිබූ නිලධාරීන් දෙදෙනෙකු ඊට මාස 06 ක කාලයකට පෙර විදේශ සංචාරවලට සහභාගීවී තිබුණි.

(ආ) දේශීය ශිෂ්‍යත්ව කමිටුවේ සහ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය නොමැතිව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පුහුණු පාඨමාලාවකට සහභාගීවී තිබුණු අධ්‍යක්ෂ (මූලස්ථාන මෙහෙයුම්) වෙනුවෙන් පාඨමාලා ගාස්තු ලෙස රු.50,000 ක් ද, ඊට අනුබද්ධ විදේශ ක්ෂේත්‍ර චාරිකාවක් සඳහා රු. 242,148 ක් ද, සමාලෝචිත වර්ෂයේ ගෙවා තිබුණද අධිකාරියේ ප්‍රතිපත්ති අනුව මෙබඳු ආකාරයේ පුහුණු පාඨමාලා සඳහා ලබා දෙන උපරිම මුදල රු. 30,000 ක් වුවද, එයට අනුකූලව කටයුතු කර නොතිබුණි.

(ඇ) ආයුර්වේද හා දේශීය වෛද්‍යවරුන් 500 ක් සඳහා එක්දින වැඩසටහනක් 2014 සැප්තැම්බර් 06 දින රු.565,263 ක් වැයකර බදුල්ල තැපැල් කාර්යාලයීය ශ්‍රවනාගාරයේදී පවත්වා තිබුණි. මහවැලි ජනපදිකයින් අතර පැතිරී යන වකුගඩු හා දියවැඩියා රෝග නිවාරණය සඳහා

වෛද්‍යවරුන් දැනුවත් කිරීම වැඩසටහනේ අරමුණ වුවද, වැඩසටහන් විස්තරයක් හා සම්පත්දායකයන් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොවීය. වැඩමුළුවට වෛද්‍යවරුන් 69 දෙනෙකු පමණක් සහභාගීවී තිබුණද, පුද්ගලයන් 460 දෙනෙක් සඳහා නිල ඇඳුම් බෙදාදී තිබුණි.

**03.** මූල්‍ය සමාලෝචනය
-----------------------

**3.1** මූල්‍ය ප්‍රතිඵල
---------------

ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේදී අධිකාරියේ හා එහි පරිපාලිත සමාගම්වල මෙහෙයුම් ප්‍රතිඵලය රු.492,686,000 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.50,530,000 ක ඌනතාවයක් වූයෙන් ඒකාබද්ධ මූල්‍ය ප්‍රතිඵලවල රු.442,156,000 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි.

**3.2** විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය
-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමට ප්‍රධාන වශයෙන් පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී පුද්ගල පඩිනඩි සියයට 15 කින් වැඩිවීම හා වාර්ෂික ක්ෂය සියයට 73 කින් වැඩිවීම හා මහා භාණ්ඩාගාරයෙන් ලද ප්‍රාග්ධන ප්‍රතිපාදන ඉක්මවා රු.123,683,000 ක් වැය කිරීමත් යන කරුණු හේතුවී තිබුණි. කෙසේ වුවද පසුගිය වර්ෂයට සාපේක්ෂව වාර්ෂික බදු ආදායම රු. 103,633,000 කින් හෙවත් සියයට 38 න් වැඩිවී තිබුණි.

(ආ) අධිකාරියේ මුළු ඉපැයූ ආදායමට, අධිකාරිය සමඟ ඒකාබද්ධ කරන ලද සමාගම් 04 හි දායකත්වය ඉපැයූ ආදායමට සියයට 7 ක් ද, මුළු වියදමට සියයට 2 ක් ද, මුළු අලාභයට සියයට 0.37 ක් ද (ලාභය රු. 1,859,000) ස්ථාවර වත්කම්වල දායකත්වය සියයට 3.67 ක් වී තිබුණි.

**3.3** ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි
-------------------------------------------------------------------------

අධිකාරිය විසින් විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව බාහිර ආයතන හා පුද්ගලයන් 179 ක් විසින් නිවාස සන්තකය ආපසු ලබාගැනීම ආදී හේතු නිසා අධිකාරියට එරෙහිව අධිකරණවල නඩු 179 ක් ගොනු කර තිබුණි.

අධිකාරියේ ප්‍රධාන කාර්යාලය සහ "බී" කලාපයේ නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය විසින් නිවාස හා ඉඩම් සන්තකය ලබාගැනීම හා වෙනත් කරුණු සම්බන්ධයෙන් බාහිර ආයතන හා පුද්ගලයන් 143 කට එරෙහිව අධිකරණවල නඩු 143 ක් ගොනුකර තිබුණි.

**4.** මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

**4.1** කාර්යසාධනය
-----------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) <u>ඉඩම් සංවර්ධන කටයුතු</u>

මහවැලි මහ සැලැස්මට අනුව මහවැලි කලාප 14 ක සංවර්ධනය කිරීමට අපේක්ෂිත වූ මුළු බිම් ප්‍රමාණය හෙක්ටයාර 420,170 කි. 2014 දෙසැම්බර් 31 දිනට සංවර්ධනය කර තිබූ බිම් ප්‍රමාණය හෙක්ටයාර 102,528 ක් වූ අතර, මොරගහකන්ද ව්‍යාපෘතිය යටතේ වර්තමානයේ සංවර්ධනය කෙරෙමින් පවතින බිම් ප්‍රමාණය හෙක්ටයාර 81,422 කි. මේ අනුව හෙක්ටයාර 236,220 ක් සංවර්ධනය කිරීම සඳහා නිශ්චිත සංවර්ධන වැඩපිළිවෙලක් 2014 දෙසැම්බර් 31 දින දක්වා සකස් කර නොතිබුණි.

කෙසේ වුවද, මහවැලි මහ සැලැස්ම වර්තමාන අවශ්‍යතාවයන්, ස්වභාවික සම්පත්වල ස්වභාවය හා භාවිතය සැලකිල්ලට ගෙන යාවත්කාලීන කිරීම 2013 වර්ෂයේදී අවසන් කර තිබුණද 2015 ජුනි 30 දින දක්වාත් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාල 3 ක, ව්‍යාපෘති 3 ක හා ප්‍රධාන කාර්යාලයේ අංශ 5 ක විස්තරාත්මක ක්‍රියාකාරී සැලසුම් පරීක්ෂාවේදී අනාවරණය කරගත් පරිදි එම අංශ සඳහා 2014 වර්ෂය වෙනුවෙන් ඇස්තමේන්තු කර තිබූ මුළු වියදම රු.මිලියන 795 ක් වූ අතර, රු. මිලියන 76.397 ක් වූ කාර්යයන් ක්‍රියාත්මක කර නොතිබුණි. තවද, 2014 ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් නොවූ රු. මිලියන 33.18 ක් වටිනා කාර්යයන් ක්‍රියාත්මක කර තිබුණි. රු.මිලියන 88.37 ක් වූ කාර්යයන් 4 ක නිමැවුම් මට්ටම සියයට 10 ට වඩා අඩු බව නිරීක්ෂණය වූ අතර, රු.මිලියන 5,930.082 කට ඇස්තමේන්තු කරන ලද කාර්යයන් 14 ක සම්පූර්ණ ප්‍රතිශතය සියයට 10 සිට සියයට 40 දක්වා විය.

(ඇ) <u>ඉඩම් අංශයේ කාර්යසාධනය</u>

යථාර්ථවාදී නොවන ඉලක්ක ස්ථාපිත කිරීම් හා අදාල අංශවල අකාර්යක්ෂමතාවයන් හේතුවෙන් 2009 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා ඉඩම් අංශයේ ප්‍රධාන ක්‍රියාකාරකම් 09 කට අදාලව ඉලක්කගත කාර්යයන් 899,605 ක් පැවති අතර, එයින් කාර්යයන් 653,805 ක් හෙවත් සියයට 72.7 ක් සම්පූර්ණ කර නොතිබුණි. තවද 2009 සිට 2014 දක්වා වර්ෂ 06 ක මෙම කාර්යයන්හි කාර්යසාධනය සියයට 11 සිට සියයට 45 ක් දක්වා විය.

එසේම ඉඩම් සංවර්ධන ආඥා පනත හා රජයේ ඉඩම් ආඥා පනත යටතේ විවිධ කාර්යයන් සඳහා ඉඩම් කට්ටි 19,647 ක් බෙදාදීමට, අවසර පත්‍ර හා දීමනා පත්‍ර 57,717 ක් ලබාදීමට හා වාර්ෂික අවසර පත්‍ර 3,840 ක් හා දිගුකාලීන බදුකර 1,807 ක් ලබාදීමට සමාලෝචිත වර්ෂයේදී සැලසුම් කර තිබුණද , පිළිවෙලින් ඉඩම් කට්ටි 4,343 ක් , අවසර පත්‍ර හා දීමනා පත්‍ර 28,819 ක් සහ වාර්ෂික අවසර පත්‍ර 1,258 ක් හා බදුකර 542 ක් පමණක් ලබා දී තිබුණි.

**4.2** කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මහවැලි ඒකාබද්ධ "බී" ව්‍යාපෘතිය යටතේ එක් කාර්යයක් සඳහා සකස් කළ මුළු පිරිවැය ඇස්තමේන්තුව කොටස් කීහිපයකට බෙදා වෙන් කර එක් කොන්ත්‍රාත්තුවක් රු.මිලියන දෙකකට අඩුවන සේ පුද්ගලයන් කිහිපදෙනෙකු වෙත කොන්ත්‍රාත් 11 ක් ප්‍රදානය කර තිබූ අතර ,එහි මුළු ඇස්තමේන්තු අගය රු.17,020,085 ක් විය.

(ආ) මහවැලිතැන්න ව්‍යාපෘතිය යටතේ එක් කාර්යයක් වූ බෝධියාගම ආරු සහ මල්වැන්න අතර වෙළඳපළ මාර්ගය ඉදිකිරීම සඳහා වූ කාර්යය කොටස් 11 කට වෙන් කර කොන්ත්‍රාත් 07 ක් එකම කොන්ත්‍රාත්කරුවකුටද, තවත් කොන්ත්‍රාත් 03 ක් තවත් එක් කොන්ත්‍රාත්කරුවකුටද ලබාදී තිබුණද කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා වූ ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටු නිර්දේශ විගණනයට ඉදිරිපත් නොවුණි. කොන්ත්‍රාත් 07 ක් පිරිනමා තිබූ කොන්ත්‍රාත්කරු යෝජිත කාර්යයන්ට අමතරව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13 ඡේදය පරිදි ඇස්තමේන්තු සකස් කර පූර්ව අනුමැතියක් ලබාගැනීමකින් තොරව අමතර වැඩ ලෙස බෝක්කු 06 ක් ඉදිකර තිබුණි.

(ඇ) 2014 වර්ෂය තුළ අධිකාරිය විසින් පැවැත්වූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 09 ක් සඳහා ඉදිරිපත් කර තිබූ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සංඛ්‍යාව 238 ක් විය. මෙයින් නිලධාරීන්ට පත්වීම් ලබාදීම් සම්බන්ධ පත්‍රිකා 115 ක් ද, ඉඩම් බදුදීම් සම්බන්ධ පත්‍රිකා 103 ක් ද, ගිණුම් හා විගණන වාර්තා සම්බන්ධ පත්‍රිකා 6 ක් ද ඉදිරිපත් කර තිබුණද වෙනත් කාර්යයන් වෙනුවෙන් ඉදිරිපත් කරන ලද පත්‍රිකා සංඛ්‍යාව 14 ක් පමණක් විය.

**4.3** මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ව්‍යාපාර සංවර්ධන අංශය විසින් 2014 දෙසැම්බර් 31 ට කෘෂිකාර්මික හා ව්‍යාපාර සංවර්ධන කාර්යය සඳහා ලබාදී තිබූ හෙක්ටයාර 9369.4 ක් වූ ඉඩම් සංඛ්‍යා 437 ක් වුවද ඉඩම් ලබාදීමේ ක්‍රමවේදය, මේ සඳහා භාවිතා කළ හැකි උපරිම ඉඩම් ප්‍රමාණයන් සහ පුද්ගලයන් හඳුනාගැනීම පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ නිශ්චිත හා පැහැදිලි ප්‍රතිපත්තියක් විගණනයට ඉදිරිපත් නොවුණි. එසේම ඉඩම් දීර්ඝකාලීන බද්දට ලබාදෙන පුද්ගලයන් හඳුනා ගැනීමේදී සුදුසු නිර්ණායකයන් නිශ්චය කර නොතිබුණි. ව්‍යාපෘති සැලැස්මක් ඉදිරිපත් කිරීම පමණක් සුදුසුකම සේ සලකා කටයුතු කර තිබුණු අතර අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද ආයෝජන සැලසුම් අධිකාරිය විසින් පිළිගත හැකි ආකාරයට ඇගැයීම් කර නොතිබුණි. 1991 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා ඉඩම්ලාභීන් 52 දෙනෙකු වෙත ලබාදී තිබූ හෙක්ටයාර 404.56 ක් වූ ඉඩම අදාල සංවර්ධන කටයුතු ඉටුකර නොතිබූ අතර එම ඉඩම් ගිවිසුම් පරිදි ආපසු පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි

(ආ) 2014 දී විසුරුවා හැරීමට තීරණය කර තිබුණු මහවැලි ඉංජිනේරු සේවා (පෞද්ගලික) සමාගමට අයත් රත්මලාන කල්දෙමුල්ල පිහිටි යාන්ත්‍රික වැඩපල වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ පැවතුණද මේ වත්කම් බදු පදනමට හෝ වෙනත් ආකාරයකට පැවරීමක් සිදුකර එහි කටයුතු විධිමත් කිරීමට කටයුතු කර නොතිබුණි. තවද, වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් වැව් හා ජලාශ සඳහා වාන් දොරටු සකස් කිරීමේ කටයුතු සඳහා තාවකාලික ගොඩනැගිල්ලක්ද ඉදිකර තිබුණි.

යාන්ත්‍රික වැඩපල සඳහා වෙනම විදුලි මීටරයක් හා ජල මීටරයක් සවිකර නොතිබූ බැවින් අධිකාරිය විසින් සියළු බිල්පත් පියවා තිබුණි. 2014 වර්ෂයේදී යාන්ත්‍රික වැඩපල ආරම්භ කළ පසු විදුලි වියදම හා ජල වියදම පිළිවෙලින් 2013 වර්ෂයට සාපේක්ෂව රු. 157,745 කින් හා රු. 43,780 කින් වැඩිවී තිබුණි.

**4.4** මතභේදයට තුඩුදෙන ගණුදෙනු

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරියේ නොවන අමාත්‍යාංශ හා අමාත්‍ය කාර්ය මණ්ඩලයේ නිලධාරීන් පස් දෙනෙක් වෙත ඉන්ධන වියදම් වශයෙන් 2014 සැප්තැම්බර් 30 දක්වා රු. 451,038 ක් අවිධිමත් ලෙස ලබාදී තිබුණි.

(ආ) 2010 දෙසැම්බර් 28 දිනැති අංක ආර්බීඑම්/ඊඅයිජ්/එම්එච්/10-5 දරන අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මඟින් ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් තොරව පවරා තිබූ චන්ද්‍රිකාවැව කුඩා විදුලිබලාගාරයක් පවත්වාගෙන යාමේ ව්‍යාපෘතිය මහවැලි උපදේශක සේවා කාර්යාංශය (පෞද්ගලික) සමාගම වෙත පවරා තිබුණද 2014 නොවැම්බර් 30 දින දක්වාම ක්‍රියාත්මක කර නොතිබුණි. 2014 දෙසැම්බර් 04 දින පැවති 258 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමකින් තොරව 2014 ඔක්තෝබර් 30 දින ස්ථාපනය කර තිබූ චන්ද්‍රිකාවැව හයිඩ්‍රොපවර් (පෞද්ගලික) සමාගම වෙත නැවත පැවරීමට අනුමැතිය ලබාදී තිබුණු අතර එම සමාගම සතු සුදුසුකම් පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය සලකා බලා නොතිබුණි.

(ඇ) ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් නොවූ කාය වර්ධන හා ශරීර සුවතා මධ්‍යස්ථානයක් පිහිටුවීමට වික්ටෝරියා කොත්මලේ කලාපයේ නේවාසික ව්‍යාපාර කළමනාකරු විසින් ඉදිරිපත් කළ රු.400,000 ක ඇස්තමේන්තුවක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කර තිබුණි. එහෙත් අළුතින් ආරම්භ කරන මෙම කාර්යයෙහි අවශ්‍යතාවය, උපරිම වියදම් සීමාව, පවත්වාගෙන යායුතු ආකාරය, භාවිතා කිරීම පිළිබඳ හඳුන්වාදී ඇති පාලනය පිළිබඳ කිසිදු ප්‍රතිපත්තිමය වැඩපිළිවෙලක් සකස් කර නොතිබුණි. මේ සඳහා ලබා දී තිබූ රු.392,750 ක භාණ්ඩ වගකිවයුතු නිලධාරියෙකු වෙත පැවරීමකින් හා භාවිතයෙන් තොරව නිල නිවාස අංක 56 හි ස්ථානගත කර තිබුණි.

(ඈ) අධ්‍යක්ෂ ජනරාල් විසින් වික්ටෝරියා කොත්මලේ නේවාසික ව්‍යාපාර කළමනාකරුගේ නිල නිවසට LED රූපවාහිනි යන්ත්‍රයක් මිලදී ගැනීමට අනුමැතිය ලබාදුන් ලිපියේ 3D යන වචනය අවිධිමත් ලෙස එකතුකර 2014 නොවැම්බර් 29 දින රු. 149,900 කට 3D රූපවාහිනියක් මිලදී ගෙන තිබුණි. නිල නිවසකට මිල අධික 3D රූපවාහිනියක් ලබාදීම ආර්ථික වශයෙන් ඵලදායී නොවන බව නිරීක්ෂණය විය.

(ඉ) රත්මලාන යාන්ත්‍රික වැඩපල සඳහා අමාත්‍යාංශ ලේකම්වරයා විසින් 2012 අගෝස්තු 22 සිට ක්‍රියාත්මක වන පරිදි ii ශ්‍රේණියේ ඉංජිනේරුවරයෙකු අධිකාරියට බඳවා ගෙන තිබුණි. යාන්ත්‍රික වැඩපල විධිමත් පරිදි වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමකින් තොරව එම දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ උක්ත නිලධාරියා 2013 දෙසැම්බර් 17 දින යාන්ත්‍රික වැඩපලේ සේවයට වාර්තා කර තිබුණි. 2014 වර්ෂය සඳහා මෙම නිලධාරියා වෙත වැටුප් හා දීමනා සහ අර්ථසාධක අරමුදල් ලෙස එකතුව රු. 726,674 ක් ගෙවා තිබූ තිබුණි. එම මුදල් වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූරණය කර ගැනීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි.

4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්
-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වික්ටෝරියා කොත්මලේ නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයට අයත් A ශ්‍රේණියේ නිල නිවාස 2 ක් 2004 සහ 2011 වර්ෂවල සිටම අළුත්වැඩියා කටයුතු

සිදුනොකිරීම හේතුවෙන් භාවිතයට ගෙන නොතිබුණි. තවද, A ශ්‍රේණියේ නිල නිවාසයක් හිමි නිලධාරියෙකු 2014 ජනවාරි සිට 2015 අගෝස්තු 31 දක්වා අධිකාරියට අයත් සංචාරක නිවාසයේ නොමිලේ නවාතැන් ගෙන සිටින බැවින්, එහි එක් කාමරයක් ඉල්ලුම්කරුවන් වෙත ලබාදිය නොහැකිව පැවතුණි. ඒ අනුව නිලධාරියාට නිල නිවසක් ලබානොදීම නිසා දිනකට රු.1,000 බැගින් සංචාරක නිවාසයෙන් ලබාගත හැකිව තිබූ ආදායමද අහිමි වී තිබුණි.

(ආ) “ සී “ කලාපයේ නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය විසින් 2002 වර්ෂයේ සිට ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙහි පවත්වාගෙන යන එකතුව රු. මිලියන 48 ක් වූ චක්‍රීය අරමුදල් තැන්පතු 2 ක මුදල් එහි අරමුණු ඉටුකර ගැනීම සඳහා උපයෝජනය කර නොතිබුණි. තවද, වාර්ෂිකව ගණනය කරන ලද පොලී මුදල මුල් තැන්පතුවට එකතු කර පොලී ලැබෙන ආකාරයට බැංකුව පොලී ගණනය කර නොතිබූ අතර, 2014 දෙසැම්බර් 31 දිනට අධිකාරියට ගෙවිය යුතු සමුච්චිත පොලිය රු. 24,998,107 ක් ලෙස බැංකුව සහතික කර තිබුණි.

4.6 ආර්ථික නොවූ ගනුදෙනු

------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 වර්ෂයේදී අවස්ථා දෙකකදී වලව හා වැලිඔය නේවාසික ව්‍යාපාර කළමනාකාර කාර්යාල මඟින් ඔප්පු 3055 ක් බෙදාදීම සඳහා ඔප්පු ප්‍රදානෝත්සව 2 ක් පැවැත්වීම වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව රු.19,538,336 ක වියදමක් දරා තිබුණි. මේ සඳහා 2013 අයවැය ප්‍රතිපාදන වෙන් කර නොතිබූ අතර, ක්‍රියාකාරී සැලැස්මටද ඇතුළත් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ක්ෂේත්‍ර නිලධාරීන්ට යතුරු පැදි 785 බෙදාදීම සඳහා පවත්වන ලද උත්සවය වෙනුවෙන් රු. 2,315,835 ක් වියදම්කර තිබුණි.

4.7 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්වල ව්‍යාපෘති ආරම්භ කිරීම

---------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පෞද්ගලික සමාගමට අයත් කොළඹ 07, ආනන්ද කුමාරස්වාමි මාවතේ පිහිටි ඉඩමේ මහවැලි මධ්‍යස්ථානය (Mahaweli Centre) ඉදිකිරීම සඳහා අධිකාරිය විසින් රු.108,154,180 ක් වැයකර තිබුණි.

(ආ) ප්‍රාදේශීය ලේකම්ට අයත් රත්මලාන කල්දෙමුල්ල පිහිටි හෙක්ටයාර් 0.45 ක් පමණ ඉඩමක පුහුණු මධ්‍යස්ථානය, වාහන සේවා ස්ථානය හා යාන්ත්‍රික වැඩපල ඉදිකර තිබුණි.

4.8 වෙනත් ආයතන වෙත ලබාදුන් අධිකාරියේ සම්පත්

--------------------------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට පටහැනිව 2015 ඔක්තෝබර් 30 දින වනවිට අධිකාරියට අයත් වාහන 14 ක් රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු භාවිතා කරමින් පැවතුණ අතර, එක් වාහනයක් නුවරඑළිය අධිකරණය භාරයේ පැවතුණි.

4.9 කාර්ය මණ්ඩල පරිපාලනය

----------------------------

2014 දෙසැම්බර් 31 දින වනවිට අධිකාරිය විසින් වෙලි ආරක්ෂණ හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය වෙත නිලධාරීන් 34 ක් පූර්ණකාලීන හා අර්ධකාලීන පදනම මත නිදහස් කර තිබුණි. එහෙත් මෙම නිලධාරීන් නිදහස් කරන ලද පදනම මත සේවයේ යෙදවෙන බවටත්, එම කාලපරිච්ඡේදය අවසාන වනවිට විධිමත්ව අධිකාරිය වෙත සේවයට වාර්තා කරන බවට විගණනයට තහවුරු නොවුණි. මේ සම්බන්ධයෙන් 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය සහ 2007 දෙසැම්බර් 20 දිනැති අංක 33 (1) දරන සංශෝධිත චක්‍රලේඛ කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.

5 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-------------------------------------

5.1 ක්‍රියාකාරී සැලැස්ම

--------------------

සමාලෝචිත වර්ෂය සඳහා සකස් කර තිබූ ක්‍රියාකාරී සැලැස්මේ ඒ ඒ කාර්යයන් ඉටුකිරීම සඳහා වගකිවයුතු නිලධාරීන් හඳුනාගෙන නොතිබුණි.

5.2 අභ්‍යන්තර විගණනය

---------------------

2010 නොවැම්බර් 30 දින සිට විගණිත දිනය වන 2015 අගෝස්තු 31 දක්වාම අධ්‍යක්ෂ අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩුව පැවති අතර, අභ්‍යන්තර විගණන වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

5.3 ප්‍රසම්පාදන සැලැස්ම

----------------------

සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර තිබූ නමුත්, එය ප්‍රමාණවත් පරිදි ක්‍රියාවේ යොදවා නොතිබුණි.

5.4 අයවැය ලේඛනමය පාලනය

-----------------------------

වර්ෂය ආරම්භයේ අයවැය ලේඛනයක් සකස් කර තිබුණද , වර්ෂය අවසානයේදී සිදුවී ඇති වැය හා අයවැයගත වියදම සමඟ වෙනස් නොවන පරිදි සංශෝධිත අයවැයක් සකස්කර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන තිබුණි. එම නිසා අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදවා ගෙන නොතිබුණි.

5.5 නොවිසඳී ඇති විගණන ඡේද

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ලංකා විදුලිබල මණ්ඩලයේ මුළු ජල විදුලිබල නිෂ්පාදනයෙන් සියයට 50 ක් පමණ මහවැලි ජලාශ ආශ්‍රිත ජල විදුලිබලාගාර මඟින් නිපදවන අතර, පොල්ගොල්ල, වික්ටෝරියා සහ කොත්මලේ යන ජලාශවල වෙලි මත වූ විදුලි පහන් සඳහා අධිකාරිය විදුලිබල මණ්ඩලයට විදුලි ගාස්තු ගෙවන නමුත් ජලාශ නඩත්තුව හා විදුලිබල මණ්ඩලය ප්‍රයෝජනයට ගන්නා ජලය වෙනුවෙන් ගාස්තු ගෙවීමක්ද සිදුනොකරන බැවින්, මෙම ප්‍රධාන වෙලිවල විදුලි අවශ්‍යතාවය නොමිලේ සපයා ගැනීමට අධිකාරිය අවධානය යොමු කළයුතුව ඇත.

(ආ) පොල්ගොල්ල, කොත්මලේ, බෝවතැන්න, මාපාකඩ, මාදුරුඔය හා වික්ටෝරියා ජලාශ ආශ්‍රිත රක්ෂිත භූමි භාග තුළ අනවසර පදිංචිකරුවන් 655 ක් සිටින බව හෙළිදරව් වූ අතර, ඔවුන් ඉවත් කිරීමට හා නැවත නැවත පදිංචිවන අනවසර පදිංචිකරුවන් පැමිණීම වැලැක්වීමට අධිකාරිය අපොහොසත්වී තිබුණි.

(ඇ) එච් කලාපයේ නේවාසික ව්‍යාපාර කළමනාකරු වෙත වෙන් කර තිබූ වාහනයට අමතරව තවත් වාහනයක් භාවිතා කර තිබුණි. මෙම වාහනය 2010 මැයි මාසයේ සිට 2011 දෙසැම්බර් දක්වා කාර්යාල පරිශ්‍රයට පැමිණ නොතිබූ බව ආරක්ෂක අංශ විසින් පවත්වා තිබූ ගේට්ටු ලේඛන අනුව නිරීක්ෂණය වූ නමුත්, නේවාසික ව්‍යාපාර කළමනාකරු විසින් එහි සියළු ගමන් සඳහා ඔහුගේ අත්සන යොදා සහතික කර තිබුණි.

මෙම වාහනයේ රියදුරු වාහනයේ දෛනික ධාවන කටයුතු තඹුත්තේගමින් ආරම්භ කරන බව දක්වා තිබුණද, 2010 පෙබරවාරි සිට 2011 දෙසැම්බර් දක්වා ඔහු කිසිදු දිනක තඹුත්තේගම කාර්යාලයේ පැමිණීමේ හා පිටවීමේ ලේඛනයේ අත්සන් කර නොතිබුණි.

මෙම වාහනය කාර්යාලයේ භාවිතා නොකළ කාලය තුළ අළුත්වැඩියා සහ ටයර් 04 ක් යෙදීම සඳහා රු. 201,385 ක වියදමක් දරා තිබූ අතර, ඒ සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් ආරම්භ කර ඇති බව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් දන්වා තිබුණි.

(ඈ) සී/ස මහවැලි ලයිව්ස්ටොක් එන්ටර්ප්‍රයිසස් සමාගමේ ප්‍රයෝජනය සඳහා අධිකාරිය විසින් නිරාවිය සහ කලංකුට්ටිය ගොවිපලවල ප්‍රයෝජනය සඳහා ලබාදී තිබූ ඉඩම් සඳහා වර්ෂයකට ලැබිය යුතු බදු කුලී ගණනය කර සමාලෝචිත වර්ෂයේ ගිණුම්වලට ඇතුළත් කර නොතිබුණි. 2013 වර්ෂයේ සිට අදාල ගොඩනැගිලි සඳහා බදු අයකිරීමට කටයුතු කරන බව 2013 දෙසැම්බර් 04 දිනැති අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පිළිතුරු ලිපියෙන් මා වෙත දන්වා තිබුණද, 2013 හෝ 2014 වර්ෂවලද එපරිදි ක්‍රියාකර නොතිබුණි.

(ඉ) ඉඩම් අංශයේ වාර්තා අනුව 2014 දෙසැම්බර් 31 දිනට නීත්‍යානුකූල නොවූ අනවසර අල්ලා ගත් ඉඩම් කට්ටි සංඛ්‍යාව 7,333 ක් වූ අතර, මේවා නීත්‍යානුකූල කිරීමේ ප්‍රමාදය හේතුවෙන් බදු කුලී ලබාගත හැකි ඉඩම්වලින් ලබාගත හැකි බදු ආදායම් අධිකාරියට අහිමි වන බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතාවයන් වරින් වර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමු කර ඇති අතර, පහත සඳහන් ක්ෂේත්‍රයන් පිළිබඳව අධිකාරියේ විශේෂ අවධානය යොමු කළයුතු වේ.

(අ) ස්ථාවර වත්කම් පාලනය
(ආ) ගබඩා පාලනය
(ඇ) මූල්‍ය පාලනය
(ඈ) වාහන පාලනය
(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය